


# Cervical Cancer (ගැබ් ගෙල පිළිකා)



**වෛද්‍ය හර්ෂ අලුත්ගේ**
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre

ගැබ්ගෙල (Cervix) යනු ස්ත්‍රීන්ගේ ප්‍රජනන පද්ධතියේ අවයවයන් වන ගර්භාෂයේ පහළම කොටසේ පිහිටි උපාංගයකි.

සෑම වසරකම වික්ටෝරියානු කාන්තාවන් 180 - 200 අතර සංඛ්‍යාවකට ගැබ් ගෙල පිළිකා වැළඳී ඇති බව හඳුනා ගැනේ.

මෙම පිළිකාව සෑම විටම හිමුන් පැපිලෝමා වෛරසය (Human Papilloma Virus) නැමැති ආසාධනය හා සම්බන්ධව ගැබ් ගෙලේ සෛලවල ඇතිවන වෙනස්කම් නිසා හටගන්නා රෝගී තත්වයකි.

ගැබ් ගෙලෙහි සෛලවල ඇතිවන වෙනස්කම් කල්තබා හඳුනා ගැනීම සඳහා කරන Pap Test නැමැති පරීක්ෂාව ආරම්භ කළ පසුව මෙම පිළිකා රෝගීන්ගේ අඩුවක් දක්නට ඇත. මක් නිසාද Pap Test මගින් එම වෙනස්කම් කල් තබා හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිකාරවලට යොමු කර හැකි බැවිනි.

ඔබ වයස 18ත් 70ත් අතර කවදා හෝ ලිංගික සම්බන්ධතා පැවැත්වූ කාන්තාවක් නම්, වසර 2කට වරක් එම පරීක්ෂණය කරවා ගැනීම වැදගත්ය.

## ගැබ් ගෙලෙහි කර්තව්‍යය කුමක්ද ?

මෙය ගර්භාෂයේ පහළම කොටස වන අතර ගර්භාෂය යෝනී මාර්ගයට විවෘත වන දොරටුවයි. එය පහත සඳහන් කාර්යයන් සඳහා උපකාරී වේ.

- යෝනි මාර්ගය තෙත්ව පවත්වා ගැනීම
- ශුක්‍රානු සංසරණය සඳහා අවශ්‍ය තරලය ශ්‍රාවය කිරීම
- ගර්භනී අවස්ථාවල කලලය ගර්භාෂය තුල රඳවා තබා ගැනීමට උපකාරී වීම

## ගැබ් ගෙල පිළිකාවේ රෝග ලක්ෂණ මොනවාද ?

බොහෝවිට කිසිදු බාහිර රෝග ලක්ෂණයක් නොපෙන්වයි. රෝගය ඇතිබව හඳුනා ගැනීමේ එකම මග බොහෝ විට ඉහත කී Pap Test පරීක්ෂාවයි.

කලාතුරකින් යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය රුධිර වාහනය, ශ්‍රාවයක් පිටවීම (Discharge) හා වේදනාව වැනි රෝග ලක්ෂණ පෙන්නුම් කළ හැකිය.

## ගැබ් ගෙල පිළිකාවේ ප්‍රධාන ප්‍රභේද මොනවාද ?

සෛලවල ඇතිවන වෙනස්කම අනුව ප්‍රධාන ප්‍රභේද 2 ක් ඇත.

01 Squamous Cell Cancer - ප්‍රධානතම ප්‍රභේදය මෙයයි. ගැබ් ගෙල මතුපිට එය ආවරණය කරන සෛලවල අසාමාන්‍යතා නිසා මෙය හටගනී. Pap Test මගින් පහසුවෙන් හඳුනාගත හැකිය.

02 Adenocarcinoma - මෙය ඉතා විරලය. ගැබ් ගෙල මාර්ගයේ ඇති ග්‍රන්ථිවල හට ගැනෙන වෙනස්කමකි. ඡව ඕඑ මගින් හඳුනා ගැනීම අපහසුය.

## ගැබ්ගෙල පිළිකා සඳහා අවදානම් සාධක කවරේද ?

මෙම පිළිකාව සෑම විටම හට ගන්නේ Human Papilloma වෛරසය නිසා සෛලවල ඇතිවන අසාමාන්‍ය වර්ධනයක් නිසාවෙනි.

මෙම වෛරස ලිංගික සංසර්ගයේදී එක් අයෙකුගෙන් අනෙක් පුද්ගලයාට සංසරනය වේ. එබැවින් අධික ලෙෂ ලිංගිකව සක්‍රිය (විශේෂයෙන් වැඩි සහකරුවන් සංඛ්‍යාවක් හා එක්වී ඇති) ස්ත්‍රීන් හට රෝගය වැළඳීමේ ප්‍රවනතාව වැඩිය.

එසේම දුම්පානය හා තම ශරීරයේ ප්‍රතිශක්තිය අඩු වීම (විශේෂයෙන් වෙනත් පිළිකා සඳහා පිළිකා නාශක ඖෂධ ලබා ගන්නා හෝ HIV වැනි ආසාධන ඇති අයට) මෙම ගැබ්ගෙල පිළිකා වැලඳීමේ අවදානම වැඩිය.

## ගැබ්ගෙල පිළිකාව හා Human Papilloma වෛරසය අතර ඇති සම්බන්ධය කුමක්ද ?

එම වෛරස් ආසාදනය සුලභ නමුත් එම ආසාදනයට ලක්වන බහුතරයකට ගැබ් ගෙල පිළිකා වැළඳගන්නේ නැත. ඊට හේතුව නම් ඔබගේ ශරීරයේ ඇති ප්‍රතිශක්තිය මගින් එම වෛරසය බොහෝ විට වසර 1 - 2 අතර කාලයක් තුළදී ශරීරයෙන් තුරන් කරන බැවිනි.

කලාතුරකින් එලෙස ශරීරයෙන් තුරන් නොවී ඉතිරි වී පවතින වෛරස මගින් ගැබ් ගෙල සෛල වල ඇති කරන අසාමාන්‍යතා නිසා පිළිකා රෝග තත්තවයට ගොදුරු විය හැකිය.

## Pap Test පරීක්ෂාව කර ගැනීමේ වාසිය කුමක්ද ?

ඉහත කී සෛලවල වෙනස්කම් කලින් හඳුනා ගැනීමට හොඳම ක්‍රමය මෙයයි. එලෙස හඳුනා ගන්නා වෙනස් කම් බොහෝවිට සුළු වෙනස්කම් වන අතර ඒවා වසර 1 - 2 ගතවන විට සාමාන්‍ය තත්වයට පත්වේ.

එලෙස කල්තබා හඳුනාගත් අයගේ නිරන්තරයෙන් නැවත පරීක්ෂාව සිදුකර රෝගය සුව අතට හෝ අවදානම් අතට හැරෙනවාද යන්න නිරීක්ෂණය කල හැක.

## ගැබ්ගෙල පිළිකා හඳුනා ගැනීමේ පරීක්ෂණ

Colposcopy - අන්වීක්ෂයක් වැනි උපකරණයකින් ගැබ්ගෙල පරීක්ෂා කර වෙනස්කම් හඳුනා ගැනේ.

Biopsy - නිර්වින්දනය කර තරමක විශාල පටක සාම්පල ලබාගෙන පරීක්ෂා කිරීම සිදු කරයි.

## රෝගය සඳහා ඇති ප්‍රතිකාර මොනවාද?

01. Cone Biopsy - ඉහත විස්තර කල පටක සාම්පලය ලබාගන්නා අවස්ථාවේදීම අසාමාන්‍ය සෛල දුටුවොත් ඉවත් කිරීම මෙහිදී සිදු කෙරේ. බොහෝ විට රෝගයේ මූලික අවධිය සඳහා සුදුසු ප්‍රතිකර්මයකි.

02. Hysterectomy - ගර්භාෂය ශල්‍යකර්මයක් මගින් ඉවත් කිරීම

03. Radiotherapy නමැති විකිරණ ප්‍රතිකාර

04. Chemotherapy නමැති ඖෂධමය පිළිකා නාශක ප්‍රතිකාර

සමහර විට රෝගය ප්‍රමාද වී හඳුනා ගතහොත් එය ශරීරයේ වෙනත් අවයවවලට පැතිරී ඇත්නම් රෝගය සුව කරනු වෙනුවට රෝග ලක්ෂණ පාලනය කිරීම හා රෝගියාව සුවපහසුව තැබීම සඳහා ප්‍රතිකාර කරනු ලැබේ. මෙය Palliative Care නමින් හඳුන්වයි.

## Human Papilloma වෛරස එන්නත (HPU Vaccine)

ඍඡඹ වෛරසයේ ප්‍රභේද විශාල සංඛ්‍යාවක් ඇත. මෙයින් ඍඡඹ ඔහචැ 1 හෝ 18 යන ප්‍රභේද වැඩි වශයෙන්ම (70% පටක) ගැබ්ගෙල පිළිකාවලට හේතුකාරක වේ.

එසේම සමහර ප්‍රභේද (උදා: HPU Type 6 හෝ 11) වැඩි වශයෙන් ඨැබසඒක ද්‍රවී නැමැති ඇතිවීමට හේතුකාරක වේ.

එම වෛරස් වලට එරෙහිව එන්නතක් ලබාදීම රෝගය වලක්වා ගැනීමේ මහඟු ප්‍රතිකර්මයකි.

ඨ්රීසක නැමැති එන්නත ඉහත කී වෛරස් ප්‍රභේද 4ම ආවරණය කරන අතර එය 7 වන ශ්‍රේණියේ පාසැල් ලමුන්ට (වයස 12 හා 13 අතර ගැහැනු, පිරිමි දෙගොල්ලන්ටම) නොමිලයේ ලබාදේ.

වසර 2013 දී එය පිරිමි ළමුන්ට ද ලබාදීමආරම්භ කල අතර පිරිමින්ගේ ශිෂ්ණයේ හා ගුද මාර්ගයේ




ආශ්‍රිතව ඇතිවන පිළිකා වලක්වා ගැනීමට එය උපකාරීවන බව සොයාගෙන ඇත.

මෙම එන්නත වඩා සාර්ථක වන්නේ යම් අයෙකු ලිංගික සම්බන්ධතා පළමුවරට ආරම්භ කිරීමට පෙරාතුව ලබාගත හොත්ය.

එන්නතේ මාත්‍රා 3ක් මාස 6ක කාල පරාසයක් තුල ලබාගත යුතුය.

එසේම පාසල් ලමුන්ට හැර වෙනත් කැමති ඕනෑම අයෙකුට මෙය මුදල් ගෙවා එන්නත් කරවා ගත හැක.

## වැඩිදුර විස්තර ලබාගත හැකි ක්‍රම

- ඔබගේ පවුලේ වෛද්‍යවරයා හමුවීම
- නාරි හා ප්‍රසව රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමුවීම
- Wome’s Health Nurse
- Family Planning Victoria - T.P. (03) 92570100 හෝ 1800013952
- Pap Screen Victoria Tel 131120
- Cancer Council Help Line Tel 121120

